# උඩඟු මාලුවා



B.A. SENUMI GIHANSA BANDARA

# උඩඟු මාලුවා

B.A.SENUMI GIHANSA BANDARA

# උඩගු මාලුවා

බී.ඒ.සෙනුමි ගිහන්සා බණ්ඩාර

2 ශ්‍රේණිය D

මහාමායා බාලිකා විදුහල

මහනුවර

මුද්‍රණය

2025.02.08

කතෘ ගේ වෙනත් කෘති

- මිතුරුකම
- කුරුලු නුවණ

ISBN– 978 – 624 – 208 - 174 - 8

# <u>පිදුම</u>

මිණිකැට මෙන් මුතු අකුරු එකිනෙක
පද බැද
සිප් සතර මුල පුරන්නට දිරිය දුන්
මාගේ ගයත්‍රී ගුරු මෑණියන්ටද
නිතැතින් මාගේ සෙවනැල්ල මෙන්
හිදිමින් සියලු කාර්යන්ට ශක්තියක්
වන
මාගේ මවට , පියාට
පුදමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙනේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතිය ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජිවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

එක කාලෙක ලස්සන කැලයක් මැද ලස්සන විලක් තිබුණා. ඒ විල ළඟ ලස්සන ගඟක් ද තිබුණා.



ඒ විලේ ලස්සන මාළුවෙක් හිටියා.  එයා හරිම ආඩම්බරයි.



ඒ මාළුවාට හිතුණා "මේ විලට වඩා ගඟ හරිම ලස්සන ඇති. විශාල ඇති. අනික මේ විලේ ඉන්න මාළුවෝ මම තරම් ලස්සන නෑනෙ" කියලා.



ඔන්න ඉතින් ලස්සන මාළුවාට අවස්ථාවක් ලැබුණා ගඟට යන්න. ඒ කොහොමද දන්නවද?

දවසක් ලොකු වැස්සක් ඇවිත් ගඟයි විලයි දෙකම වතුරින් යට වූ විට ලස්සන මාළුවා හොරෙන් විලෙන් ගඟට පීනලා පීනලා ගියා.

ගඟේ ලස්සන බලමින් මාළුවා පීනුවා. ගඟත් ලොකුයි. ලස්සන ලස්සන මාළුවෝ ගොඩක් ඉන්නවා කියලා මේ මාළුවා සිතුවා.




මේ ලස්සන මාලුවා ගඟේ ඒ මේ අත සෑම තැනකම පීනුවා. ගඟේ පතුලටම ගොස් පැළෑටි වල රස බැලුවා.

පාට පාට අනෙක් මාලුන් සමඟ යහළු වෙන්න උත්සහ කළා.

නිදහසේ පීනන්න ඉඩ තියෙන නිසා මේ මාළුවා ගොඩක් සතුටු වුණා. ඒත් ඒ සතුට ගොඩක් වෙලා තිබුණේ නැහැ.

එකපාරටම ලොකු මාළුවෝ දෙන්නෙක් ඇවිත් මේ මාළුවා පස්සෙන් පැන්නුවා.




මාළුවා බයෙන් ඈතට පීනුවා. ඇස් දෙක වහගෙන තමන්ට හැකි පමණින් ඉතා වේගයෙන් පීනාගෙන යන්නට වුණා.

ඇස් අරිද්දී මාළුවා කලින් සිටිය විලටම ගිහිල්ලා.



කලින් සිටිය යාලුවෝ අභිංසක ලෙස තමා දිහා බලාගෙන සිටියා. ලස්සන මාලුවාට දුක හිතුනා.

මේ මාළුවා අනෙක් මාළුවන්ගෙන් සමාව අරගෙන සතුටින් සිටියා.






''අපි මොන තරම් ලස්සන වුණාත් උඩඟු වෙන්න හොඳ නෑ. හැමෝම එක්ක සතුටින් ඉන්න ඕනේ.'' කියලා මේ ලස්සන මාලුවට හිතුනා.

පාසලේදී අපිත් අපේ යාළුවන් එකතු වන විට හැමෝම එකමුතු වී වැඩ කරන්නට එකිනෙකාට ගෞරව කරන්න පුරුදු වෙන්න ඕනේ.

එතකොට තමයි පුංචි අපේ ලෝකයත් ලස්සන වෙන්නේ.



# පසුවදන

රටේ අනාගත සංවර්ධනය ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශිය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායීතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ ධරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ ඔක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්